**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**නීති පීඨය**

**නීතිවේදී උපාධි පරීක්ෂණය - සිව්වන වසර - 2020**

**පරිසර නීතිය**

**පැ තුනයි (03)**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව - **07**

ප්‍රශ්න හතරකට **(04)** පමණක් පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත් අකුරු වලට ලකුණු අඩු කෙරේ)

---

**01.** චිරස්ථායි සංවර්ධනය විසින් ජාතික සංවර්ධන සංදර්භය තුළ සමාජ, ආර්ථික සහ පාරිසරික ප්‍රමුඛතාවන් අතර සමබරතාවක් ඇති කිරීමට බලාපොරොත්තු වේ. 2015දී එක්සත් ජාතීන්ගේ චිරස්ථායි සංවර්ධන අරමුණු සම්මත කරගැනීමට තදනන්තරව ලෝක ප්‍රජාව විසින් ජාතික මට්ටමේදී චිරස්ථායි සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේදී ඉතා පුළුල් වපසරියක විහිදෙන කැපකිරීම් මෙකී අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා සිදු කිරීම අවශ්‍යතාවකි.

චිරස්ථායි සංවර්ධන සංකල්පයේ විකාශය, පරිසර නීතියේ විකාශය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

**02.** 'සුපර් පවර් ප්‍රයිවට් ලිමිටඩ්' යනු, රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචි පෞද්ගලික සමාගමකි. එහි නිෂ්පාදනාගාරය රත්මලානේ පිහිටා ඇත. 'සුපර් පවර් ප්‍රයිවට් ලිමිටඩ්' එහි නිෂ්පාදන ක්‍රියාවලිය 2020 දී ආරම්භ කරන ලදී. එතැන් පටන් නිෂ්පාදනාගාරය අසළ වාසය කරන්නන් හට නිෂ්පාදනාගාරයෙන් නිකුත් වන ශබ්දය,

තාපය සහ දූහුවිල්ල නිසා බාධා එල්ල වී ඇත. ඔවුන් අතරින් ඇතැමෙක් හට දරුණු ලෙස තිව්සුම් යාම සහ සමේ රෝග පිළිබඳ රෝග ලක්ෂණ පෙන්නුම් කිරීමට පටන් ගෙන ඇත. මෙකී රෝග ලක්ෂණ දිගු කාලීන ශ්වසනාබාධ සහ සමේ රෝග දක්වා වර්ධනය විය හැකි බවට වෛද්‍යවරුන් ඉතා විශ්වසනීය ලෙස තහවුරු කර ඇත. තව දුරටත් මෙම කාලය ඇතුළත තම ගස්, පැළෑටිවල නිරෝගී භාවය වියකී ගොස් ඇති බව අසල්වාසීන්ට පෙනී යයි. මූලික පසුබිම් සමාලෝචනයකදී 'සුපර් පවර් ප්‍රයිවට් ලිමිටඩ්' ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත්තේ නියමිත බලපත්‍රයක් ලබා නොගෙන බව අසල්වාසීන් සොයා ගනී.

සුපර් පවර් ප්‍රයිවට් ලිමිටඩ් ට එරෙහිව නඩුකරයක් ගෙන ඒමට ප්‍රදේශවාසීහු ඔබගේ නෛතික උපදෙස් බලාපොරොත්තු වෙති. අදාළ ව්‍යවස්ථාවන් සහ අධිකරණ තීන්දු උපුටා දක්වමින් ඔවුන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 25)

**03.** ජීවත් වීමේ අයිතිය සහ ඒ හා සම්බන්ධ වෙනත් මානව හිමිකම් තුළ පරිසරයට ඇති අයිතිය හඳුනා ගැනීම තුන්වන පරම්පරාවේ මානව හිමිකම් කතිකාව තුළ ප්‍රහර්ෂයට ලක් වූවකි. දේශගුණික විපර්යාසය නිසා සිදුවන බලපෑම් සමඟම ලෝක ප්‍රජාව ක්‍රම ක්‍රමයෙන් අද වන විට දේශගුණික විපර්යාසය සහ මානව හිමිකම් අතර පවතිනා සමීප අන්තර් සම්බන්ධතා විමර්ශනය කිරීමට පිවිසී ඇත. අනාගතයේදී මෙකී අන්තර් සබඳතාව මානව හිමිකම් දෘෂ්ටියෙන් පාරිසරික ආරක්ෂණය වෙනුවෙන් පෙනී සිටින්නන් විසින් "ස්වභාවධර්මයේ අයිතිය" ලෙස ඉතා පුළුල් පරාසයක සමරනු ඇත. ස්වභාවධර්මයේ අයිතිය නැමති සංකල්පය විසින් මිනිසා පරිසරයේ කොටසක් ලෙස නිවැරදි ස්ථානයෙහි පිහිටුවා තබා තම සංරක්ෂණය උදෙසා නෛතික ස්ථීතිය ලබා ගැනීම වෙනුවෙන් ස්වභාවධර්මයට අයිතිය ඇති බව හඳුනා ගනු ඇත. මානව හිමිකම් සහ පරිසර ආරක්ෂාව අතර පවතින අන්තර් සම්බන්ධතාව ඇසුරෙන් ඉහත ප්‍රකාශය විමර්ශනාත්මකව විග්‍රහ

කරන්න. ඔබගේ විශ්ලේෂණය තුළ ලොව ඕනෑම නෛතික පර්ෂද දෙකක් පිළිබඳව සංසන්දනාත්මක විග්‍රහයක් අන්තර්ගත විය යුතුය.

(ලකුණු 25)

**04**. පෙයර්ලන්තයේ පෙන්ගුයිනා ප්‍රදේශය ආශ්‍රිතව මෑතකදී සමුද්‍ර ඛාදනය පිළිබඳ සිදුවීම් කිහිපයක් වාර්තා විය. පෙයර්ලන්තයේ වෙරළ සංවර්ධනය කිරීමේ දෙපාර්තමේන්තුව විසින් දකුණු වෙරළෙහි කි.මී. 3ක පමණ ප්‍රදේශයක් ආවරණය වන පරිද්දෙන් කෘත්‍රිම ලෙස වැලි පුරවා වෙරළ පෝෂක කලාපයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධන ඇතුළත් සංවර්ධන උපාය මාර්ග යටතේ මෙකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතියට වැය වන පිරිවැය ලෙස රජයේ භාණ්ඩාගාර අරමුදලින් ආසන්න වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 150 ක මුදලක් වය වන බව තක්සේරු කර ඇත. පරිසර සහ චිරස්ථායි සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශ නිලධාරීන් ප්‍රකාශ කර සිටින්නේ පෙන්ගුයිනාහි වෙරළ විශාල ලෙස ඛාදනය වීමෙන් වැළක්වීම උදෙසා මෙකී ව්‍යාපෘතිය කඩිනම් කල යුතු බවයි.

ව්‍යාපෘතිය අදියර තුනක් යටතේ පැවැත්වේ. පළමු අදියර යටතේ කි.මී. 1.5 ක් දිග මීටර් 25ක් පළල කෘත්‍රිම වෙරළ තීරයක් නිර්මාණය වේ. මේ සඳහා කියුබික් මීටර් ලක්ෂ දෙකක පමණ වැලි පිරවිය යුතුය. පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු මේ වන විටත් පෙන්ගුයිනා වෙරළ තීරයේ ආරම්භ කර ඇත. මෑතකදී පැවති පුවත්පත් සාකච්ඡාවකදී වෙරළ සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා විසින් ජාතික පාරිසරික අධිකාරියේ අනුමැතිය නොවිමසා මෙබඳු ක්‍රියාවන් සඳහා අවසර ලබා දීමට අධ්‍යක්ෂකවරයට ඇති බලය පිළිබඳ වැදගත් කරුණු කිහිපයක් උළුප්පා දැක්විය.

පෙන්ගුයිනා වෙරළ පෝෂක ව්‍යාපෘතිය සඳහා පාරිසරික බලපෑම් තක්සේරු කාර්යය පටිපාටිය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පූර්වයෙන් අනුගමනය කිරීම අනිවාර්යය නොවන බව අධ්‍යක්ෂකවරයා විසින් පිළිතුරු දෙමින් අවධානය කළේය.

මේ අතරතුර පෙන්ගුයිනා වෙරළ පිරවීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකිරීමෙන් අනතුරුව පාරිසරික නීති සහ ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඉන් උද්ගත විය හැකි භයානක පාරිසරික ගැටළු සම්බන්ධව පර්යේෂණ වාර්තාවක් එළි දැක්වීය. මෙම වාර්තාවේ මුඛ්‍ය තර්ක ලෙස දැක්වූයේ මහජන මුදල් නාස්තිය සහ ව්‍යාපෘතියේ තිරසාර බව සම්බන්ධයෙන් පවතින ගැටළුය. මීට පිළිතුරු ලෙස වෙරළ සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක ප්‍රකාශ කරන ලද්දේ ව්‍යාපෘතිය සඳහා අරමුදල් පසුගිය වසරේ අනුමත වූයේ යෝග්‍යතා වාර්තාවක් සිදු කිරීමෙන් අනතුරුව බවත් එකී වාර්තාවේ මෙම ව්‍යාපෘතියෙහි තිරසාරභාවය පිළිබඳව ව්‍යාපෘතිය ආරම්භ කිරීමට මත්තෙන් විමසා බැලූ බවත්ය.

ඔබ, පෙයර්ලන්තයේ වෙරළ හා සාගර සම්පත් ආරක්ෂා කිරීම තම න්‍යාය පත්‍රය ලෙස ක්‍රියාත්මක කරන සාගර සහ වෙරළ සම්පත් භාරය නමැති රාජ්‍ය නොවන සංවිධානයේ නීතිඥවරයාය. ඉහත කරුණු විමර්ශනය කර, පෙන්ගුයිනා ව්‍යාපෘතියට අදාළව අනුගමනය කළ කාර්යය පටිපාටිය සහ අධ්‍යක්ෂකවරයා විසින් ගනු ලැබූ තීරණ පිළිබඳව මතු කල හැකි නෛතික තර්කයන් අගයන්න.

(ලකුණු 25)

**05.** 'පවතින ව්‍යවස්ථාපිත මාර්ගෝපදේශයන්හි දුර්වලතාවයන් සහ මහජනතාව තුළ අවබෝධයේ පවතින හීනතාව යන කරුණු, ශ්‍රී ලංකාවේ පාරිසරික සංරක්ෂණයෙහි උද්ගතව පවතින අභියෝග වලට හේතුකාරක වේ.'

පාරිසරික නීති ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියක කනිෂ්ට පර්යේෂකය ලෙස ඔබව පත් කර ඇති බවට උපකල්පනය කරන්න. **ජාතික පාරිසරික පනත සහ ඔබ විසින් තෝරා ගනු ලබන වෙනත් ඕනෑම පනත් 02ක්** ඇසුරෙන් අධිකරණ අමාත්‍යවරයාට යොමු කිරීම සඳහා ඔබ විසින් වාර්තාවක් සකසන්න.

(ලකුණු 25)

**06 (අ)** සහ **(ආ)** කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

**(අ)** යම් රාජ්‍යක ස්වභාවික සම්පත් කෙරෙහි එම රාජ්‍ය සතු වන්නාවූ රාජ්‍ය ස්වාධිපත්‍ය එම රාජ්‍යයට අනෙකුත් රාජ්‍යයන් සහ දේශසීමාවන්ට ඔබ්බෙන් පවතින වෙනත් ප්‍රදේශයන් කෙරෙහි පවතින්නා වූ රාජ්‍ය වගකීම මගින් සීමා වේ. සාකච්ඡා කරන්න.

(ලකුණු 13)

**(ආ)** වර්තමානයේදී අන්තර්ජාතික නීතිය තුළ සුලභවම සාකච්ඡාවට බඳුන් වන ක්ෂේත්‍රය වන්නේ දේශගුණික විපර්යාසය වන බවට සැක නැත. ගෝලීය තලයේදී කාලගුණික විපර්යාසය සම්බන්ධයෙන් වන කරුණු අන්තර්ජාතික නීතියේ සමස්ථ අංශ මත හානිකර බලපෑම් ඇති කරයි. ගෝලීය මණ්ඩල මගින් දේශගුණික විපර්යාසය හඳුනා ගැනීම තදනන්තරව රාජ්‍යයන් තුළ ජාතික මට්ටමේ ගනු ලබන තීරණ කෙරෙහි බලපෑම් සිදු කරයි.

ඔබ එකඟ වන්නේද? අවම වශයෙන් **රාජ්‍යයන්** දෙකක අධිකරණ භාවිතාව තුළ දේශගුණික ප්‍රතිපත්තීන්හි අදාළත්වය පිළිබඳව සිදුවූ වර්ධනයන් අගයන්න.

(ලකුණු 12)

**(07)** පහත දැක්වෙන සංකල්ප හා මූලධර්ම වලින් දෙකක් තෝරාගෙන පරිසර ආරක්ෂණය සම්බන්ධ ප්‍රමුඛතම අන්තර්ජාතික හා දේශීය ලේඛන තුළ එම සංකල්පයන්හි අදාළත්වය සාකච්ඡා කරන්න.

(අ) නිවාරණ මූලධර්මය

(ආ) සාමූහික නමුත් වෙනස්කොට දක්වන වගකීම් පිළිබඳ මූලධර්මය

(ඇ) අන්තර් පාරම්පරික සාධාරණත්ව මූලධර්මය

(ඈ) පොදු භාර සිද්ධාන්තය

(ලකුණු 25)

*****************************************